# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2189/49 - 2020 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2020.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර ලබා නොගෙන සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු ලෙස පත්වූ සිදම්බරම් වසන්ති අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තෝරාඑවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රාමලිංගම් යෝකේස්වරි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් රාමලිංගම් යෝකේස්වරි , නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**තිළිණ වික්‍රමරත්න,**
තේරීම්භාර නිලධාරි,
නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 20 වැනි දින,
අම්පාර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

09 - 116

1A - G 32717 — 29 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*